පාර්ලිමේන්තු මහා මැතිවරණය

- 2020 -

# තැපැලෙන් ඡන්දය දීම.......




CMEV
CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

## ~ හැඳින්වීම ~

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) යනු, මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියට මෙන්ම මැතිවරණ ප්‍රතිසංස්කරණ කාර්යය උදෙසා ද ක්‍රියාකාරී දායකත්වයක් දක්වමින් සිටින මැතිවරණ නිරීක්ෂණ සංවිධානයකි. එය අරඹන ලද්දේ වසර 1997 දී වන අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානය (INFORM) එහිලා ප්‍රමුඛත්වය ගත් සංවිධාන ත්‍රිත්වයයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීමේ අරමුණ ද සහිතව ඇරඹූ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය අද වන විට මැතිවරණ සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මෙන්ම අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරක පිරිවැය පිළිබඳ නිරීක්ෂණය කිරීමේ කාර්යය ද තම ප්‍රමුඛ අරමුණක් සේ සළකනු ලබයි.

පරිගණක අකුරුකරණය,

**කේ. ඒ. ඩිල්කි මධුෂිකා**

ප්‍රකාශිත දිනය,

**2020 ජූලි 01**

ප්‍රකාශනය,

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)**

නො. 160G, පූර්වාරාම පාර, කිරුළපන, කොළඹ 05.

+094-11 2826388/+094-11 2826384

**ෆැක්ස්** : +094-11 2826146 **විද්‍යුත් ලිපිනය** : cmev@cpalanka.org
**වෙබ් අඩවිය** : www.cmev.org

# ~ පෙරවදන ~

**ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවය මැතිවරණ සාක්ෂරතාවයයි....**

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මෙරටේ පිළිගත් මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් වන අතර වසර 1997 පටන් මැතිවරණ නිරීක්ෂණය මෙන්ම මෙරටේ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ද පුළුල් දායකත්වය දක්වමින් සිටී.

ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් පිළිබඳ ආශක්ත පුරවැසි සමූහයක් දිවිගෙවන ශ්‍රී ලාංකීය සමාජයට මැතිවරණ සාක්ෂරතාවය යන්න අරුමැසි යමක් නොවේ. තමන් අභිමත මහජන නියෝජිතයා තෝරා ගැනීමේ සම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාව මෙරටේ ජනයා අත්හදා බලනුයේ දශක ගණනාවක සිටය. එහිලා ශ්‍රී ලාංකේය ඡන්දදායකයාට තුටුපහටු වියහැකි එක් කරුණක් පිළිබඳව සටහන් කළ යුතුමය. එනම් මෙරටේ මෙතෙක් පවත්වා ඇති මැතිවරණ කෙරෙහි කවර බාධාකාරී තත්වයක් මතු වුවද, ඒ සෑම විටෙකදීම රටෙහි පාලන තන්ත්‍රය හෙබවීම සඳහා නියෝජිතයන් තෝරාගෙන ඇත්තේ පුළුල් මහජන සහභාගීත්වයක් සහිත මැතිවරණ ඔස්සේ වීමයි.

තම ඡන්දය නිවැරදිව භාවිතා කිරීමේ සිට ඒ ඒ මැතිවරණ ක්‍රමවේදවලට අනුගතව නියෝජිතයන් තෝරා ගැනීම දක්වා සමස්ත ක්‍රමවේදයට අනුගත වීමේදී ඡන්දදායකයා දක්වන බුහුටි බව මැතිවරණ සාක්ෂරතාවය යැයි හැඳින්විය හැකිය. මෙරටේ ඡන්ද භාවිතය හා වෙනත් අවශේෂ කරුණු පිළිබඳ සලකා බලන කල මැතිවරණ සාක්ෂරතාවය වඩාත් ප්‍රශස්ථ මට්ටමක ඇතැයි පැවසිය හැකිය. එහෙත් ඒ හා සබැඳි මැතිවරණ නීතියෙහි අත්‍යාවශ්‍ය අංග පිළිබඳ ඔවුන් දැනුමින් සන්නද්ධ යැයි සිතීම දුෂ්කරය. එය වඩාත් දුෂ්කරව ඇත්තේ නීතිය ගැන ලියන්නෝ එවැනි දේ ලියන්නේ ද කියවන්නාට ගෝචර නොවන ශාස්ත්‍රීය බසින් හෝ යාන්ත්‍රික බසින් වීමයි.

ඉහත අභියෝගය ජය ගැනීමේ එක් මඟක් වනුයේ හැකිතාක් මැතිවරණ නීතිය සහ මැතිවරණ ක්‍රියාවලිය හා සබැඳි කරුණු සරල බසින් ලියා ජනගත කිරීමයි. මෙරටේ තැපැල් ඡන්ද ක්‍රමවේදය හා එහි නීතිය පිළිබඳ මෙම සරල සටහන එළි දක්වන්නේ ඒ අනුවය. මෙහිලා අවැසි උපදේශකත්වය සැපයූ ජ්‍යෙෂ්ඨ නීතිඥ සහ මැතිවරණ කොමිෂන් සභාවේ නීති අංශයේ අධ්‍යක්ෂ නිමල් ජී. පුංචිහේවා මහතා වෙත අප සංවිධානයේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමු. ශ්‍රී ලාංකේය ඡන්දදායකයන් තමන්ට අභිමත මහජන නියෝජිතයා තෝරා ගැනීමේ දී වඩවඩාත් මෙවන් ප්‍රකාශන උපයෝගී කර ගැනීමට පෙළඹෙන්නේ නම් එය අපගේ ප්‍රහර්ශයට කරුණකි.

ස්තූතියි,

මංජුල ගජනායක
ජාතික සම්බන්ධීකාරක

# පාර්ලිමේන්තු මැතිවරණය - 2020

## තැපෑලෙන් ඡන්දය දීම

**<u>තැපැල් ඡන්ද</u>**

ඡන්ද විමසීමකදී එම ක්‍රියාවලිය සඳහා මැතිවරණ කොමිෂන් සභාව, පොලීසිය සහ රාජ්‍ය නිලධාරීගේ සුසංයෝග අත්‍යවශ්‍ය වේ. මෙහිදී ඡන්ද විමසීම් දිනයේ මැතිවරණ රාජකාරීවල හා ඒ හා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදීම නිසා එම තැනැත්තන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් නොලැබේ. මේ නිසා එවැනි තැනැත්තන්ට ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් තැපෑලේ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මැතිවරණ නීති මඟින් අවකාශ සළසා ඇත. මේ සඳහා විධි විධාන,

I. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

II. 1981 අංක 07 දරන ජනමත විචාරණ පනත

III. 1981 අංක 15 දරන ජනාධිපති තෝරා පත්කර ගැනීමේ පනත

IV. 1981 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීමේ පනත

සහ

V. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) ඇතුළත්ව ඇත. සමහර රටවල මේ සඳහා ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් පූර්ව ඡන්ද මධ්‍යස්ථාන ඇති කිරීම වැනි ක්‍රමවේද යොදා ගත්ත ද ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතිය තුළ ඒ සඳහා තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය භාවිතා වේ. තැපැල් ඡන්ද හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳව මැතිවරණ නීතියේ සඳහන් වන අතර, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී පහත සඳහන් ගණයන්ට තැපැල් ඡන්ද හිමිකම් ඇති බව දැක්වේ.

i. ශ්‍රී ලංකා යුධ හමුදාවේ සාමාජිකයකු

ii. ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු

iii. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු

iv. ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයකු හෝ සේවකයකු

v. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු

vi. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු

vii. තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු

viii. විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු

ix. ශ්‍රී ලංකා මධ්‍යම ගමනා මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු

x. ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු තම සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොටගෙන පෞද්ගලිකව තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ ඡන්දය දීමට නොහැකි වීම හෝ නොහැකි වීමට ඉඩ තිබීමේ හේතුව මත

xi. රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු ඡන්ද විමසීම් පවත්වන දිනයේ තෝරා පත් කර ගැනීමේ කටයුතු සඳහා කාර්යය සඳහා සේවයේ නියුක්ත කරනු ලැබීමට ඉඩ තිබීමේ හේතුව නිසා

xii. තම අපේක්ෂකත්වය නිසා වෙන් කරන ලද ඡන්ද පොළෙන් ඡන්දය දීමට නොහැකි වීමේ හේතුව මත අපේක්ෂකයකුට (23(2) වගන්තිය)

**<u>අයදුම් කිරීම</u>**

1) මැතිවරණය ප්‍රකාශයට පත්කළ නියමයේ දින සිට දින හයක් ඇතුළත, ඒ තැනැත්තා ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින මැතිවරණ කොට්ඨාශයේ තේරීම්භාර නිලධාරී වෙත/සහතික කිරීමේ නිලධාරී මඟින් පනතේ 2 වන උපලේඛනයේ ආකෘතිය සාරානුකූලව ඉදිරිපත් කළ යුතුය. (අදාළ ආකෘතිය යා කොට ඇත.) (23(3) - වගන්තිය) ආකෘති පත්‍රය නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ.
2) තේරීම්භාර නිලධාරී විසින් එම ඉල්ලීම සම්බන්ධව සුදුස්සක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදෙන ලෙසට අයදුම්කරු වෙත දැන්වීමක් මඟින් නියම කළ හැකිය.
3) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමේ තේරීම්භාර නිලධාරී සෑහීමට පත්වන්නේ නම් හෝ නොවන්නේ නම් එම තීරණය ඉල්ලුම්කරු වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතු අතර, ඔහුගේ තීරණය අවසානාත්මක එකකි. (23(4),(5),(6) - වගන්ති)
4) අදාළ ඉල්ලීම තේරීම්භාර නිලධාරී පිළිගත් විට එම තැනැත්තා තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු වන්නේය.
5) තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද හිමිකම් ඇති එක් එක් තැනැත්තා වෙත, ඔහු සපයන ලද ලිපිනයට,
   i. ඡන්ද පත්‍රිකාවක්
   ii. අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ ආකෘතිය ('ආ' ආකෘතිය)
   iii. ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවේ මුද්‍රිත අංකය සළකුණු කරනු ලැබූ 'කවරයක්' (මෙම කවරය සාමාන්‍ය ලේඛන එවනු ලබන කවරයට වඩා කුඩාවිය යුතුය.)

iv. ඉහත ලේඛන ආපසු එවීම සඳහා කවරයක් හැකිතාක් ඉක්මනින් තැපෑලෙන් යැවිය යුතුය.)

6) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව හා ලැයිස්තුවක් තේරීම්භාර නිලධාරී විසින් තබාගත යුතුය. එහි තැපැල් ඡන්දදායකයාගේ නමට ඉදිරියෙන් ලිපිනය සඳහන් කළ යුතුවන අතර, එම ලැයිස්තුව පිළියෙල කළ වහාම පිටපතක් පරීක්ෂණය සඳහා තම කාර්යාලයෙහි තබමින් එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.
7) තැපැල් ඡන්ද පත්‍රිකාව අනෙකුත් ඡන්දදායකයන්ට දෙනු ලබන ඡන්ද පත්‍රිකා ආකෘතියෙන් වෙන්ව හඳුනා ගැනීමට නොහැකි විය යුතුය.
8) තේරීම්භාර නිලධාරියාට ලිපිකරුවන් ලෙස සහය වන තැනැත්තන් අපේක්ෂකයන් විසින් හෝ ඔහු වෙනුවෙන් සේවයෙහි යොදවනු ලැබූ කිසිවකු නොවිය යුතුය.
9) නාම යෝජනා දිනට පසු දින හයකට පෙර තැපැල් ඡන්ද නිකුත් කරනු ලබන ස්ථානය, වේලාව සහ බලයලත් නියෝජිතයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව තේරීම්භාර නිලධාරී විසින් එක් එක් බලයලත් නියෝජිතයාට දැනුම්දිය යුතුය. (10(1) - නියෝග)

**<u>තැපැල් ඡන්ද නිකුත් කිරීමේදී හා භාර ගැනීමේදී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තන්</u>**

1. තේරීම්භාර නිලධාරී හා ඔහුගේ ලිපිකරුවන්
2. බලයලත් නියෝජිතයකු
3. බලයලත් නියෝජිතයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීමට පත්කළ තැනැත්තකු
4. තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ 2ක් හෝ වැඩි සංඛ්‍යාවක් එකවර නිකුත් කළ යුතු අවස්ථාවක බලයලත් නියෝජිතයෝ පත් කරනු ලැබීමට තේරීම්භාර නිලධාරී විසින් බලය දෙනු ලැබූ එක් නියෝජිතයකු හෝ වැඩි සංඛ්‍යාවක්
   - ❖ බලයලත් නියෝජිත විසින් හා / හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් පත්කරනු ලබන අදාළ නියෝජිතයාගේ නම, ලිපිනය පිළිබඳ දැන්වීම තැපැල් ඡන්ද නිකුත් කිරීමේ නියමිත වේලාවට ප්‍රථම තේරීම්භාර නිලධාරී වෙත ලබාදිය යුතුය.

I. තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්දදායකයන් වෙත යොමු කරන ලද සියලු කවර ගණන් කොට ඉතාම කිට්ටු තැපැල් කාර්යාලය වෙත වහාම භාරදිය යුතුය.

II. තැපැල් ස්ථානාධිපතිවරයා විසින් එසේ භාරදෙන ලද කවර සංඛ්‍යාවක් සඳහන් කර තේරීම්භාර නිලධාරී ඉදිරිපත් කළ කුවිතාන්සි ආකෘතියේ දින මුද්‍රාවෙන් මුද්‍රාකර ඒවා යොමු කරන ලද තැනැත්තන් වෙත වහාම යවනු ලැබිය යුතුය. (14 - නියෝගය)

III. තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කොට අවසන් වූ පසුව හැකි ඉක්මනින් බලයලත් නියෝජිතයන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී

(අ) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවේ සළකුණු කළ පිටපත් සහ,

(ආ) නිකුත් කරනු ලැබූ තැපැල් ඡන්දවල උපපත්‍රිකා වෙත වෙනම පැකට්ටුවල අසුරා මුද්‍රා තැබිය යුතුය.

IV. තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේදී මුද්‍රා තබනු ලැබූ පැකට්ටුව තේරීම්භාර නිලධාරී විසින් විවෘත කළ හැකි අතර, නිකුත් කිරීමෙන් පසු නැවත ඒ ආකාරයෙන් මුද්‍රා තැබිය යුතුය.

V. තැපැල් ඡන්දදායකයන්ගෙන් ලැබෙන ආවරණ කවර දැමීම සඳහා ඡන්ද පෙට්ටි සැපයීමේ බලයලත් නියෝජිතයන්ගේ නියෝජිතයෙක්ට විවෘත හා හිස්ව පෙන්වා තේරීම්භාර නිලධාරීගේ හා කැමති නියෝජිතයන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා ඒ මැතිවරණ කොට්ඨාශයේ අංකය හා නම සලකුණු කරනු ලැබිය යුතුය.

## නියෝජිත කාර්යය භාරය

1. එම නියෝජිතයෝ අපේක්ෂකයාගේ බලයලත් නියෝජිතයෝ ලෙස සලකනු ලබයි.
2. එම තැනැත්තා 'ඇ' ආකෘතියට සාරානුකූල රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතුවන අතර, එය සාමදාන විනිසුරු හෝ තේරීම්භාර නිලධාරී ඉදිරිපිට කළ යුතුය. (9(1),(2) - නියෝග)
3. ඡන්ද විමසීම අවසන්වීමට පෙර තැපැල් ඡන්ද පත්‍රිකා මත කරනු ලැබූ නිල සලකුණ සම්බන්ධව තොරතුරු කිසිවෙකුට දැනුම් නොදිය යුතුය.
4. තැපැල් ඡන්ද පත්‍රිකාව පිටුපස ඇති අංකය සම්බන්ධ තොරතුරු කිසිවෙකුට දැනුම් දීම නොකළ යුතුය. (9(3) - නියෝග) - එම නියෝග

කඩ කිරීම රු.500/- දඩයක් හා මාස 06ක බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් වේ. (9(4) - නියෝග)

## තැපැල් ඡන්ද ස්ථාන නියෝජිතයන් (ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ)

I. යම් කාර්යාලයක්, ආයතනයක් හෝ ඒකකයක් සම්බන්ධයෙන් එම ස්ථානයේ නිලධාරීන්ගේ / සේවකයන්ගේ ඡන්දය ගැනීමට අදහස් කරන දිනය සහ ස්ථානය ''සහතික කරන නිලධාරියා'' විසින් එක් එක් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිත වෙත ද අපේක්ෂකයාගේ නියෝජිතයා වෙත ද දැනුම් දෙනු ලැබිය යුතුය. (16 අා (1) - නියෝග)

II. දේශපාලන පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයෝ හෝ ස්වාධීන කණ්ඩායම් අපේක්ෂක හෝ ඔහුගේ නියෝජිතයා විසින් ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනෙකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකිය. එම නියෝජිතයන්ගේ නම්, ලිපින හා ජාතික හැඳුනුම්පත් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා හැඳුනුම්පත් අංක සමඟ ඡන්ද විමසීම ආරම්භ වීමට පෙර සහතික කිරීමේ නිලධාරියා වෙත ලියවිල්ලකින් භාරදිය යුතුය. (16අ (2) - නියෝග)

III. එම නියෝජිතයන් යම් හේතු මත ඔවුන්ගේ නියෝජිතභාවය අවලංගු කර වෙනත් නියෝජිතයන් නම් කළ හැකි අතර එහිදී ඉහත අංක II පරිදිම ක්‍රියා කළ යුතුය.(16(3) - නියෝග)

IV. සහතික කිරීමේ නිලධාරියා වෙත විධිමත් පරිදි දැනුම් දී නොමැති කිසිම නියෝජිතයකුට ඡන්ද විමසීමට සහභාගී වීමේ අවස්ථාව නැත. (16(4) - නියෝග)

## සහතික කිරීමේ නිලධාරියා

I. ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ සාමාජිකයකු වන ඉල්ලුම්කරුවකු වන විට,
    1. ඉල්ලුම්කරු හමුදාවල අණදෙන නිලධාරී වන විට ඔවුන් විසින්ම හෝ ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඉහළම කාර්යභාර නිලධාරී වන විට ඔහු විසින්ම
    2. ඉල්ලුම්කරු ඉහත (1) ඡේදයේ කෙනෙකු නොවන විට ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඉහළම කාර්යභාර නිලධාරී අදහස් වේ.

II. රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරියකු හෝ සේවකයකු වන ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට,

1. ඒ ඉල්ලුම්කරු යම් කාර්යාලයක් භාර ඉහළම නිලධාරියා වන්නේ නම් ඒ ඉල්ලුම්කරු
2. මෙහි (1) ඡේදයේ සඳහන් තැනැත්තකු නොවන විට ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින ඉහළම නිලධාරියා අදහස් වේ.

III. අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් වන විට ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලබන මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී අදහස් වේ.

## <u>තැපැල් ඡන්ද හා සූදානම් කිරීම</u>

I. එක් එක් තැපැල් ඡන්ද පත්‍රිකාවේ නිල සළකුණු මුද්‍රා කිරීම හෝ සිදුරු කරනු ලැබ තිබේ ද යන්න.

II. ඡන්දදායකයාගේ නම සහ අංකය හඬ නගා කතා කොට ඒ ඒ ඡන්දදායකයාගේ අංකය ඒ ඒ ඡන්ද උප පත්‍රිකාව මත සටහන් කොට තිබිය යුතුය.

III. අදාළ තැපැල් ඡන්ද පත්‍රිකාව නිකුත් කළ බවට එම තැපැල් ඡන්දදායකගේ අංකය ඉදිරිපිටින් සළකුණක් තැබීම.

IV. තැපැල් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවේ සටහන් කළ යුතු තැපැල් ඡන්දදායකයාගේ අංකය තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුවේ සඳහන් ඡන්දදායකයාගේ අංකය විය යුතුය.

## <u>ඡන්දය සළකුණු කිරීම</u>

I. තම අනන්‍යතා පත්‍රය රැගෙන යන්න.

II. ලියවිලි කවරය විවෘත කිරීමට පෙර එම කවරයේ තම නම සඳහන්ව තිබේද

III. මුද්‍රා ආදිය නිසි පරිදි තිබේ ද පරීක්ෂාකාරී වන්න.

## <u>කවරයෙන් ලියවිලි එළියට ගැනීමෙන් පසු</u>

I. අනන්‍යතා ප්‍රකාශ ආකෘතියේ සහ ඡන්ද පත්‍රිකා කවරයේ (බී කවරයේ) ඇති අනුක්‍රමික අංකය හා ඡන්ද පත්‍රිකාවේ පිටුපස ඇති අංකය ද නිසි පරිදි පරීක්ෂා කිරීම.

II. නිල සළකුණින් ඡන්ද පත්‍රිකාව සිදුරු කර තිබේ ද පරීක්ෂා කරන්න.
III. සහතික කිරීමේ නිලධාරියා ඉදිරිපිට අනන්‍යතා ප්‍රකාශය සම්පූර්ණ කර අත්සන් කරන්න.
IV. <u>ඡන්ද පත්‍රිකාව ලබාගෙන රහසේ සළකුණු කරන්න.</u>
V. ''බී'' කවරය ලබා ගෙන තමා විසින්ම ඡන්ද පත්‍රිකාව ඒ තුල බහාලන්න.
VI. එය සහතික කිරීමේ නිලධාරියා හා තමා ඉදිරිපිටම මුද්‍රා තැබිය යුතුය.
VII. ''බී'' කවරය හා අනන්‍යතා ප්‍රකාශය ''ඒ'' කවරය තුළ බහා අලවා එය සහතික කිරීමේ නිලධාරියාට භාර දෙන්න.

- **තැපැල් ඡන්දය භාවිතා කළ හෝ ඉල්ලුම් කළ අයකු වෙනත් යම් ඡන්ද පොළක ඡන්දය ප්‍රකාශ කිරීම සිරදඬුවම් ලැබිය හැකි වරදකි.**

<u>තැපැල් ඡන්ද ගණන් කිරීම</u>

I. ඡන්ද විමසීම අවසන් වූ පසු හැකි ඉක්මණින් තැපැල් ඡන්ද ගණන් කිරීමට තේරීම්භාර නිලධාරී කටයුතු කළ යුතු අතර, එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම, ගණන් කිරීම ආරම්භ කරන දිනය හා වේලාව බලයලත් නියෝජිතයා වෙත ලියවිල්ලකින් දැනුම් දීම. (නියෝග - 18)
II. බලයලත් නියෝජිත විසින් තැපැල් ඡන්ද ගණන් කරන එක් එක් මධ්‍යස්ථානය සඳහා නියෝජිතයන් දෙදෙනෙකුට නොවැඩි ගණනක් පත් කළ හැකිය. එම තැනැත්තන්ගේ නම්, ලිපින සමඟ ගණන් කිරීම ආරම්භ කිරීමට ප්‍රථම ගණන් කිරීමේ නිලධාරී වෙත ලියවිල්ලකින් භාරදිය යුතුය. (නියෝග - 20)
III. ගණන් කිරීමේ නිලධාරියා හා ඔහුගේ කාර්ය මණ්ඩලය සහ ගණන් කිරීමේ නියෝජිතයන් හැර සහ ගණන් කිරීමේ නිලධාරීගේ අනුමැතිය මත හැර වෙනත් කිසිවෙකුට එම ස්ථානයට පැමිණීමට හිමිකමක් නැත. (නියෝග - 21)
IV. ගණන් කිරීමේ නියෝජිතයන් විසින් පනතේ ''ඕ'' ආකෘතිය අනුව රහස්‍යතා ප්‍රකාශක් කරනු ලැබිය යුතුය. එය ගණන් කිරීමේ නිලධාරී හෝ සාමදාන විනිසුරු ඉදිරිපිට දී විය යුතුය.
V. **තැපැල් ඡන්ද හිමියකුගේ නම, අංකය, නිල සළකුණ හෝ ඡන්ද පත්‍රිකාවේ පිටපැත්තේ සඳහන් අංකය පිළිබඳව දැනගැනීමට තැත්කිරීම, එම තොරතුරු කිසිවකුට දැනුම් දීම නීති විරෝධී වේ.**

## <u>ගණන් කිරීම</u>

I. තැපැල් ඡන්දදායකයන්ගේ සෑම ඡන්ද පෙට්ටියක්ම ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී විවෘත කළ යුතුය. (නියෝග - 23)

II. ඡන්ද පෙට්ටියේ ආවරණ කවර වෙන වෙනම ගණන් කර, පසුව එක් එක් ආවරණ කවරය වෙන වෙනම විවෘත කළ යුතුය.

III. එම කවරය තුළ,

1. අනන්‍යතා ප්‍රකාශය හා ඡන්ද පත්‍රිකා කවරය හෝ
2. අනන්‍යතා ප්‍රකාශය හා ඡන්ද පත්‍රිකා කවරය බහා <u>නොළුත්</u> ඡන්ද පත්‍රිකාවක් ඇති බව සොයාගනු ලැබූ විට,

- අනන්‍යතා ප්‍රකාශය මත සළකුණු කරන ලද අංකය ඡන්ද පත්‍රිකා කවරය මත සළකුණු කරන ලද අංකයට අනුරූප වන විට හා ගණන් කිරීමේ නිලධාරී <u>සෑහීමකට පත් වන විට</u>,

  අනන්‍යතා පත්‍රය - වෙනම බඳුනකට ද (<u>අනන්‍යතා බඳුන</u>)

  <u>ඡන්ද පත්‍රිකා කවරය</u> හෝ ඡන්ද පත්‍රිකාව - වෙනම බඳුනකට ද <u>(තැපැල් ඡන්දදායක ඡන්ද පත්‍රිකා සඳහා බඳුන)</u> දැමිය යුතුය.

3. අනන්‍යතා පත්‍රය පමණක් ඇති විට, ''අනන්‍යතා පත්‍රය ප්‍රතික්ෂේප කරන ලදී'', ''ඡන්ද පත්‍රිකාව කවරය නොලැබුණි'' යන වචන ප්‍රකාශය මත සටහන් කොට ප්‍රතික්ෂේප බඳුනට දැමීම.
4. ඡන්ද පත්‍රිකා කවරය බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක් ඇති විට ''ප්‍රතික්ෂේප කරන ලදී'', ''අනන්‍යතා ප්‍රකාශය නොලැබුණි'' ලෙස සටහන් කර ප්‍රතික්ෂේපිත බඳුනට දැමීම.
5. අනන්‍යතා ප්‍රකාශය පමණක් ඇති විට ''ඡන්ද පත්‍රිකා කවරය'' විවෘත කොට එහි අනන්‍යතා ප්‍රකාශය හා ඡන්ද පත්‍රිකාව ඒ තුළ තිබේ නම් ඡන්ද පත්‍රිකාව මත සළකුණු කළ අංකය හා අනන්‍යතා ප්‍රකාශයේ අංකය ද අනුරූපී නම් සෑහීමකට පත් වේ නම් එය ''තැපැල් ඡන්ද පත්‍රිකා බඳුන''ට දැමිය යුතුය.
6. ඒ පිළිබඳව සෑහීමකට පත් නොවන විට ''අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී'' යනුවෙන් ද සටහන් කොට, යම් නියෝජිතයකු විරෝධය දක්වයි නම්, එහිම ''ප්‍රතික්ෂේප කිරීමට විරෝදය දක්වන ලදී'' යනුවෙන් ද සටහන් කොට ''ප්‍රතික්ෂේපිත ඡන්ද බඳුනට'' දැමිය යුතුය. (නියෝග - 24)
7. මෙම කටයුතු අවසානයේ තැපැල් ඡන්ද පත්‍රිකා බඳුනේ තැබූ එක් එක් ඡන්ද පත්‍රිකා කවරය වෙන් වෙන්ව විවෘත කළ යුතු වේ. ඡන්ද

පත්‍රිකාවක් නොමැති නම්, ''ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත'' ලෙස සටහන් කොට එය ප්‍රතික්ෂේපිත ඡන්ද බඳුනට දැමිය යුතුය.

8. තැපැල් ඡන්ද පත්‍රිකා බඳුනේ ඡන්ද පත්‍රිකා, නියෝජිතයන් ඉදිරිපිට ගණන් කර එය සටහන් කළ යුතුය. මෙහි දී පනතේ 50 (3), 50 (4) සහ 51, 52, 58, 59 වගන්තිවල විධාන අදාළ වේ.

***ඇමුණුම්.....***

- පනතේ 26(2) වගන්තිය අනුව මෙම ඡන්ද විමසීම සඳහා තැපැල් ඡන්ද පහසුකම් සැලසිය යුත්තේ ඔබ විසින් මැතිවරණ රාජකාරි පැවරීමට ඉඩ ඇතැයි සලකන රාජ්‍ය නිලධාරීන්, අත්‍යාවශ්‍ය සේවාවන්හි නියුතු නිලධාරීන්, සේවකයන් සහ ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක බලකාය යටතේ දිවයිනේ සියලු ප්‍රදේශවල ආරක්ෂක කටයුතුවල නිරත පුද්ගලයින් සඳහා පමණි.

- කොවිඩ්-19 වසංගත රෝගී තත්වය මත එම කටයුතු වල යෙදෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ඇතුළු සෑම නිලධාරී කාර්යය මණ්ඩලය.

- මීට අමතරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් කැටුව යන සහයකවරු ලෙස කටයුතු කරන රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් (උදා: කාර්යාල කාර්යය සහායක, මැනුම් සහයක, පාසැල් කම්කරු) සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සහයක ලෙස කැටුව යෑමට අපේක්ෂිත පෞද්ගලික සහයකයින්ට තැපැල් ඡන්ද පහසුකම් ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කොට ඇත.

  මෙම දෙපාර්ශවයේම සහයකයින් තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීමේ දී තමා කැටුව යෑමට අපේක්ෂා කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිගේ ලිඛිත නිර්දේශයක් තැපැල් ඡන්ද අයදුම්පතට අමුණා තිබිය යුතුවේ.

  සහයකයින් ලෙස යෑමට අපේක්ෂිත රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන් පිළිබඳව සහතික කිරීමේ නිලධාරී ලෙස එම කාර්යාලයේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ක්‍රියා කළ යුතු අතර පෞද්ගලික සහයකයින්ගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/සහකාර මැතිවරණ කොමසාරිස් ක්‍රියා කළ යුතු වේ.

තමා විසින් නිර්දේශ කරන ලද කණිෂ්ඨ සේවකයා/පෞද්ගලික සේවකයා අනිවාර්යයෙන්ම ඡන්ද පොළ රාජකාරි සඳහා රැගෙන යාමට කටයුතු කරන ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් දැනුම්වත් කළ යුතු ය.

- මැතිවරණය පැවැත්වෙන දිනයේදී ඡන්ද පෙට්ටි ප්‍රවාහනය කිරීම කරනු ලබන පෞද්ගලික බස් රථ හා පෞද්ගලික වාහනවල රියදුරන් හා රිය සහයකයින්ට ද තැපැල් ඡන්ද පහසුකම් ලබා දීම සුදුසු වේ.

  එක් එක් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව අනුව මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත පෞද්ගලික රියදුරන් හා රිය සහයකයින් පූර්වයෙන් හඳුනාගත යුතු අතර ඔවුන්ගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/සහකාර මැතිවරණ කොමසාරිස් ක්‍රියාකළ යුතු වේ.

- තැපැල් ඡන්ද අයදුම්පත් ඉතා සැලකිල්ලෙන් පරීක්ෂා කළ යුතු අතර, අයදුම්පතෙහි අඩු පාඩු කිසිවක් ඔබ විසින් සම්පූර්ණ නොකළ යුතු ය. එබඳු අයදුම්පත් ප්‍රතික්ෂේප කර ඒ පිළිබඳව ප්‍රතික්ෂේප කිරීමට හේතුව ද සමග වහාම අදාළ සහතික කිරීමේ නිලධාරී මගින් අයදුම්කරු වෙත දන්වා යැවිය යුතු ය.

- අයදුම්පත් භාර ගැනීම අවසන් වූ වහාම මේ සමඟ යා කර ඇති අංක PE/2020/F4 දරන ආකෘතිය මඟින් ලැබුණු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව හා එයින් කොපමණ සංඛ්‍යාවක් අනුමත කරනු ලැබුවේ ද, කොපමණ සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ද යන්න පැහැදිලිව සඳහන් කර ප්‍රධාන කාර්යාලයට එවිය යුතු වේ. (ෆැක්ස් 011-2877618, ඊ තැපෑල channa@elections.gov.lk)

- තැපැල් ඡන්ද නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව සියලුම තොරතුරු ඇතුළත් ආකෘතිය (PE/2020/F5) ඉහත ෆැක්ස් හා ඊ තැපෑල වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

## තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- ලැබී ඇති අයදුම්පත් 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය සමග පරීක්ෂා කළ යුතු අතර, පහත සඳහන් සියලු කරුණු සපුරා ඇත්නම් එබඳු අයදුම්පත් පිළිගත යුතුය. මෙම ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදාගත යුතු නිලධාරී සංඛ්‍යාව අධික විය හැකි අතර, තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම මත ඔවුන් රාජකාරී සඳහා නොපැමිණීමේ

සම්භාවිතාව වැඩි විය හැකි ය. එම තත්ත්වය වළක්වා ගැනීම් වස් සුළු අඩුපාඩුකම් මත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**අයදුම්පත් පරීක්ෂාවේ දී සැළකිල්ලට ගත යුතු කරුණු**

- අයදුම්පතෙහි දැක්වෙන තොරතුරු (ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය, පිළිවෙළ අංකය) පරිගණකය සමඟ පරීක්ෂා කළ යුතු ය.

- අයදුම්පතෙහි පළමුව ඡන්දහිමියා විසින් තමාගේ නම වශයෙන් සඳහන් කර ඇති නම සහ දෙවනුව සඳහන් කර ඇති නාමලේඛනයේ සඳහන් පරිදි නම එකිනෙක හා සමඟ ගැලපීමේ දී එම නම් දෙකින්ම හැඳින්වෙන්නේ එකම පුද්ගලයා බව තහවුරු විය යුතු ය. එකම පුද්ගලයෙකු නොවේ යැයි සුළු හෝ සැකයක් මතු වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කළ යුතු ය. (එවැනි අවස්ථා පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලයේ තැපැල් ඡන්ද කටයුතු විෂය භාර මාණ්ඩලික නිලධාරී පුද්ගලිකව පරීක්ෂා කර තීරණ ගැනීමට කටයුතු කළ යුතු ය.)

- අයදුම්කරු ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කයේ මැතිවරණ රාජකාරී පැවරෙන අයෙකු නැතහොත් අත්‍යාවශ්‍ය සේවාවක හෝ ආරක්ෂක සේවයේ නිරත වන අයෙකු, ග්‍රාම නිලධාරීවරයෙකු, අපේක්ෂකයෙකු, දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධරයෙකු හෝ සේවකයෙකු විය යුතුය. ඊට පරිබාහිර පුද්ගලයින් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කළ යුතුය.

- අයදුම්කරු විසින් අදාළ අයදුම්පතෙහි නියමිත පරිදි අත්සන් කර තිබිය යුතු ය.

- කිසියම් තැපැල් ඡන්ද අයදුම්පතක ඡන්ද කොට්ඨාස අංකය හා නම, අනු අංකය හෝ ඡන්ද දායකයාගේ නම කපා හැර සංශෝධනය කර ඇති නම් එබඳු අයදුම්පත් අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පෙර තවදුරටත් පරීක්ෂා කිරීම සුදුසු ය. ඡන්දහිමියා විසින් දෙන ලද තොරතුරු වෙනත් පුද්ගලයෙකු විසින් ව්‍යාජ ලෙස වෙනස් කර තිබිය හැකි බැවින් එබඳු අයදුම්පතක් සහතික කිරීමේ දී සහතික කිරීමේ නිලධාරී පෞද්ගලිකවම සෑහීමට පත්විය යුතු බවත් සංශෝධනය

කරන ලද සෑම ස්ථානයකද සහතික කිරීමේ නිලධාරී විසින් අත්සන තැබිය යුතු බවත් අවධාරණය කිරීම අත්‍යාවශ්‍යය.

- ප්‍රතික්ෂේප කරනු ලබන සියලුම තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධයෙන් පෞද්ගලිකව නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් පරීක්ෂා කර තීරණ ගත යුතු ය.

- සහතික කිරීමේ නිලධාරී විසින් විධිමත්ව සහතික කර අත්සන් තබා ඔහුගේ/ඇයගේ නිල මුද්‍රාව ද අයදුම්පතෙහි නියමිත ස්ථානයේ තැබිය යුතු බවට උපදෙස් දිය යුතු වේ.

- තැපැල් ඡන්ද පැකට්ටුව යැවිය යුතු ලිපිනය වශයෙන් සහතික සහතික කිරීමේ නිලධාරීගේ නම, තනතුර සහ රාජකාරී ලිපිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු බවට උපදෙස් දිය යුතු වේ.

## තැපැල් ඡන්ද අයදුම්පත පිළිගත් බව හෝ නොපිළිගත් බව දැනුම් දීම

- සෑම තැපැල් ඡන්ද අයදුම්පතක්ම පිළිගත් බව හෝ නොපිළිගත් බව හෝ දන්වා යැවිය යුතු ය.
- පිළිගත් හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වන ලිපිය අයදුම්කරුගේ සහතික කිරීමේ නිලධාරීට පිටපතක් සහිතව අදාළ අයදුම්කරු වෙත යැවිය යුතු ය.
- අවශ්‍ය යයි ඔබ විසින් තීරණය කරනු ලබන අවස්ථාවන්හි දී අදාළ ලිපියේ පිටපතක් ඡන්ද හිමියාගේ පෞද්ගලික ලිපිනය වෙත ද යැවීම සුදුසු ය.

## තැපැල් ඡන්ද නාමලේඛන සහතික කිරීම හා අනුපිටපත් කිරීම

- තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව පිළියෙල කරනු ලැබූ වහාම තේරීම්භාර නිලධාරී විසින් එහි පිටපතක් ප්‍රදර්ශනය සඳහා තම කාර්යාලයේ තැබීමෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. එසේ ප්‍රකාශයට පත් කළ යුතු දිනය පසුව දන්වනු ලැබේ.
- තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද නාමලේඛනය සහතික කිරීමේ වගන්තිය අදාළ ඡන්ද විමසීම් පනත ප්‍රකාරව අවසාන ඡන්ද කොට්ඨාසයෙහි ඇතුළත් කර අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය.

**''1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(12) වගන්තිය ප්‍රකාරව පිළියෙළ කර දෙවැනි උපලේඛනයේ සඳහන්**

**තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග මාලාවේ නියෝග 4 යටතේ පළ කරන ලදී.''**

- තැපැල් ඡන්ද නාමලේඛන පිටපත් ලබා ගැනීමේ දී තරඟ කරනු ලබන පක්ෂයකට හා ස්වාධීන කණ්ඩායමකට නොමිලයේ එක් පිටපතක් බැගින් ලබා දිය යුතු බව ද සැළකිල්ලට ගෙන තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීම, ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පිටපත ආදී වශයෙන් අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය පිටපත් සංඛ්‍යාව තීරණය කළ යුතු ය.

## තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ දැන්වීම

- අදාළ ඡන්ද විමසීම් පනත අනුව සකස් කළ යුතුය.

  උදාහරණය - පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දෙවැනි උපලේඛනයෙහි 10(1) නියෝගය අනුව නාමයෝජනා අවසන් දිනට පසු දින 10ක් ඉකුත් වීමට පෙර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන දිනය, වේලාව, ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීමට 8 වැනි නියෝගයේ (2) ඡේදය යටතේ පත් කළ හැකි නියෝජිතයන් සංඛ්‍යාව පිළිබඳව බලයලත් නියෝජිතයන් වෙත දැනුම් දිය යුතුය. නියෝජිත සංඛ්‍යාව වනුයේ එක් නිකුත් කිරීමේ ස්ථානයකට එක් නියෝජිතයකු බැගින් වන සංඛ්‍යාවකි.

- දැන්වීම පළකළ යුතු දිනය පසුව දන්වනු ලැබේ. එම දැනුම් දීම සමඟ පනතේ 2 වන උපලේඛනයේ 8 සහ 9 නියෝගවල ඡායා පිටපතක් සහ නියෝජිතයන් පත් කිරීමේ ආකෘති ද යැවිය යුතු ය.

- තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කළ යුතු දිනය පසුව දන්වනු ලැබේ. තේරීම්භාර නිලධාරීන් විසින් බලයලත් නියෝජිතයන්ට ඒ බව දැනුම් දෙමින් යැවිය යුතු ලිපියේ ආදර්ශයක් ද යා කර ඇත. (PE/PV/F4)

## තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම

- තැපැල් ඡන්ද නිකුත් කිරීමේ ක්‍රියාවලිය එක් දිනක් තුළ අවසන් කළ හැකි වන පරිදි පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව අනුව සුදුසු නිකුත් කිරීමේ ස්ථාන හා කණ්ඩායම් සංඛ්‍යාව තීරණය කර ගත යුතු ය.

- සෑම කණ්ඩායමක් භාරවම සහකාර තේරීම්භාර නිලධාරීවරයකු සිටිය යුතු අතර, ඊට අමතරව ලිපිකරු, සමාන්තර ශ්‍රේණියේ නිලධාරීන් හය දෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයකු පත් කළ යුතු ය. මෙම

කාර්යය සඳහා ඔබ විසින් තනතුරු නාමයෙන් ගැසට් කිරීම සඳහා මා වෙත එවනු ලැබූ සහකාර තේරීම්භාර නිලධාරීන් අතුරෙන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කළ යුතු ය.

- තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දිනට පෙර තැපැල් ඡන්ද නාමලේඛනය අනුව අවශ්‍ය A,B,C, සහ D කවර සකස් කර ගත යුතු ය.

- තැපැල් ඡන්ද නිකුත් කිරීමත් සමග එම පැකට්ටු රක්ෂණ තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කාර්යාලය වෙත භාර දිය යුතු ය. මේ පිළිබඳව දිස්ත්‍රික් තැපැල් අධිකාරී සමග සාකච්ඡා කර පැකට්ටු භාරදීමේ ක්‍රියා පිළිවෙළ කල්වේලා ඇති ව සංවිධානය කර ගත යුතු ය.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ වෙනත් පරිශ්‍රයක ස්ථාන කිහිපයක දී ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම් කටයුතු සිදු කරනු ලබන බැවින් කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමඟ සාකච්ඡා කොට එම අවස්ථාවට උචිත වන පරිදි විශේෂ පොලිස් ආරක්ෂාවක් ලබා ගත යුතු ය. නිකුත් කිරීමේ ස්ථාන, පැකට්ටු භාරදෙන තැපැල් කාර්යාලය වෙත පැකට්ටු රැගෙන යන වාහනය සහ භාරගනු ලබන ස්ථාන සඳහා මෙම ආරක්ෂක පියවර යෙදිය යුතු වේ.

- ඒ ඒ නිකුත් කිරීමේ ස්ථානයට අවශ්‍ය A කවර, B කවර, C කවර, D කවර, ස්ටිකර, ගම්, ක්ලිප්ස්, අනන්‍යතා ප්‍රකාශ, රහස්‍ය මුද්‍රා, තැපැල් ඡන්ද නාමලේඛනය, නියෝජිත නාමලේඛනය, අඩිරූල්, පැන්සල් ආදී අවශ්‍ය සියලුම දෑ කල්තබා තෝරා වෙන් කර සූදානම් කළ යුතු ය. A, C, D යන කවර කල් තබා සකස් කර ගත යුතු වේ.

- තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් පසුව ආපසු එවනු ලබන A කවරයෙහි යොදනු ලබන රහස්‍ය අංකය කවරයෙහි දෙපසම හෝ ස්ථාන දෙකක සටහන් කිරීමට කටයුතු කළ යුතු ය.

- තැපැල් ඡන්ද නිකුත් කිරීම නිරීක්ෂණය සඳහා පැමිණෙන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින්ගේ පැමිණීම සටහන්කර ගැනීම, රහස්‍යතා ප්‍රකාශ ලබා ගැනීම හා එක් එක් අංශ වෙත යොමු කිරීම භාරව සහකාර තේරීම්භාර නිලධරයෙක් පත් කිරීම කළ යුතු ය.

- හිස් තැපැල් ඡන්ද පෙට්ටි නියෝජිතයින්ට පෙන්වා ඔවුන් ඉදිරිපිට දී මුද්‍රා තැබීම අත්‍යවශ්‍යය.

**තැපැල් ඡන්ද නිකුත් කිරීම් කටයුතු සම්බන්ධව පහත සඳහන් කරුණු අදාළ කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට දැනුම් දිය යුතු ය.**

- නියෝජිතයින්ට දැනුම් දී ඇති වේලාව ඉක්ම වූ වහාම නිකුත් කිරීමේ කටයුතු ඇරඹිය හැකි බව හා ඊට පෙර පැමිණ සිටින නියෝජිතයන්ගේ පත්වීම් ලිපි පරීක්ෂා කර පැමිණීම සටහන් කරගත යුතු වේ.

- සහකාර තේරීම්භාර නිලධාරී විසින් කාර්ය මණ්ඩලයෙන් සහ නියෝජිතයින්ගෙන් ''ඈ'' ආකෘතියෙහි වූ රහස්‍යතා ප්‍රකාශය ලබාගත යුතු වේ.

- නිකුත් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය ඉහත 14.6 ඡේදයේ සියලුම දෑ කල් තබා සූදානම් කර ඇති බවට නිසැක වීම.

- ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම නිරීක්ෂණය කිරීමට පැමිණෙන නියෝජිතයින්ට ඒ සඳහා අවස්ථාව සැලසීම අවශ්‍ය වේ.

- ඡන්ද පොළේ දී මෙන්ම මෙහි දී ද ඡන්ද දායකයාගේ අනුක්‍රමික අංකය සහ නම ශබ්ද නගා කියවිය යුතු වේ.

  මෙහි දී අනුක්‍රමික අංකය වන්නේ එක් එක් ඡන්ද ප්‍රදේශය අනුව සකස් වූ තැපැල් ඡන්ද නාමලේඛනයෙහි සඳහන් අනුක්‍රමික අංකය වේ. වැඩිදුර උපදෙස් සඳහා තැපැල් ඡන්ද නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙල සම්බන්ධව නිකුත් කර ඇති උපදෙස් මාලාවේ ඇති උපදෙස් කෙරෙහි සැළකිලිමත් වන්න. අදාළ උපදෙස් මාලාවේ උධෘතයක් යා කර ඇත. (PE/2020/09/I1)

**නිකුත් කිරීම් කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරීන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු කරුණු**

- තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ තැපැල් ඡන්දදායකයන්ගේ නමට අදාළ අනුක්‍රමික අංකය, ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි සටහන් කිරීම නිවැරදිව ඉටු කරන බවට නිසැක විය යුතු ය.

- ඡන්ද පත්‍රිකාවේ පිටුපස ඇති අනුක්‍රමික අංකය B කවරයේ සහ අනන්‍යතා ප්‍රකාශයේ සටහන් කිරීම නිවැරදිව ඉටුවන බව, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ ආරම්භක අවස්ථාවේ දී විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

- ඡන්දදායකයාගේ අනු අංකය සහ නම C කවරයේ නිවැරදිව සටහන් කර තිබේද යන්න පරීක්ෂා කළ යුතු ය.

- සහතික කිරීමේ නිලධාරීගේ නම සහ ලිපිනය D කවරයෙහි නිවැරදිව සටහන් කර තිබේ ද යන බව හා එම ලිපිනය සහතික කිරීමේ නිලධාරී විසින් තැපැල් ඡන්ද අයදුම්පතේ සටහන් කර ඇති ලිපිනය විය යුතු ය.

- කවරයේ නියමිත ස්ථානයේ තේරීම්භාර නිලධාරීගේ / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ නිල මුද්‍රාව තබා තිබේ ද, ඡන්දදායකයාගේ අනු අංකය සටහන් කර තිබේ ද යන කරුණු පරීක්ෂා කළ යුතු වේ.

- ඡන්ද පත්‍රිකාවේ පසුපස ඉඩ ඇති ස්ථානයක නිල ලකුණ (රහස්‍ය මුද්‍රාව) තැබීම සැලකිල්ලෙන් ඉටු කරනු ලබන බව, පිළිබඳව නිසැක වීම ද අවශ්‍යය.

- තැපැල් ඡන්දය ආපසු එවීම සඳහා අවශ්‍ය ස්ටිකරය සමග ඡන්ද පත්‍රිකාව, අනන්‍යතා ප්‍රකාශය, අපේක්ෂක ලැයිස්තුව, B කවරය සහ A කවරය යන සියල්ලක් නියමිත පරිදි එකට තබා ඇති බවට සහකාර තේරීම්භාර නිලධාරී විසින් පෞද්ගලිකව සෑහීමට පත් විය යුතු අතර අනතුරුව C කවරයේ බහා මුද්‍රා තබා නැවත D කවරය තුළ බහා ගම් ගා අලවා ඒ මත ස්ටිකරය ඇලවිය යුතු ය.

- තැපැල් කාර්යාලය වෙත මෙම රක්ෂණ පැකට්ටු භාරදීම සඳහා අදාළ නිවේදන පත්‍ර පිටපත් දෙකකින් යුතුව සකස් කර ලැබී තිබේ ද යන බව සහතික කර ගන්න. මේ සඳහා තැපැල් ඡන්ද නාමලේඛනයේ පිටපත් දෙකක් වුව ද යොදා ගත හැකිය.

- රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු තැපැල් කාර්යාලයෙන් භාරගත් බවට කුවිතාන්සි නිවැරදිව ලැබෙන බව හා එම කුවිතාන්සි සංඛ්‍යාව නිකුත් කළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමඟ ගැලපෙන බව තහවුරු කර ගත යුතු ය. ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසානයේ භාරදුන් පැකට්ටු සංඛ්‍යාව භාරගත් බවට කුවිතාන්සි ඇද්දැයි පරීක්ෂාකර එම කුවිතාන්සිය එක් එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරී විසින් ජර්නලය සමඟ ගොනු කළ යුතු ය.

➢ සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවෙන සෑම කවරයකටම නියමිත පරිදි ඡන්ද පත්‍රිකාව, අනන්‍යතා ප්‍රකාශය, අලු පැහැති ස්ටිකරය ඇතුළත් කළ බව සනාථ කර ගැනීම සඳහා නිකුත් කරන සෑම ඡන්ද පත්‍රිකා පනහකට වරක් ඉතිරි ඡන්ද පත්‍රිකා, අනන්‍යතා ප්‍රකාශ, ස්ටිකර සංඛ්‍යාව පරීක්ෂා කර බැලිය යුතු ය.

## තැපැල් ඡන්ද නිකුත් කිරීම අවසන් කිරීම

තැපැල් ඡන්ද නාමලේඛනයේ අදාළ කොටසෙහි නම් සඳහන් සියලුම ඡන්දදායකයින් වෙත ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමෙන් පසු පහත සඳහන් ලිපි ලේඛන, නියමිත පරිදි අදාළ කවරවල බහා මුද්‍රා තබා නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස් වෙත භාර දිය යුතු බව නිකුත් කිරීමේ කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙත දැන්විය යුතු ය.

- ඉතිරි ඡන්ද පත්‍රිකා
  (ඔබ වෙත තේරීම්භාර නිලධාරී විසින් භාර දෙන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව නිකුත් කළ සංඛ්‍යාව හා ඉතිරි ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමග සැසඳී තිබිය යුතු ය.)
- භාවිතා කළ තැපැල් ඡන්ද නාමලේඛන
- නියෝජිත/නිලධාරී/කාර්ය මණ්ඩල පැමිණීමේ ලේඛන
- අත්සන් කළ රහස්‍යතා ආකෘති
- රහස්‍ය මුද්‍රාව
- කාර්ය පරිපාටි සංග්‍රහය (තැපැල් කාර්යාලයෙන් ලැබුණු ලදු පත් ඇමිණිය යුතු වේ)

## තැපැල් ඡන්ද පැකට්ටු සම්බන්ධයෙන් සහතික කිරීමේ නිලධාරී වෙත පැවරෙන වගකීම්

➢ සහතික කිරීමේ නිලධාරීන් විසින් තම කාර්යාලයේ/ආයතනයෙහි තැපෑල භාරව කටයුතු කරන නිලධාරීන් දැනුවත් කර තමාගේ නමට ලැබෙන රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු, ලිපි විවෘත කිරීමකින් තොරව අප්‍රමාදව තමා වෙතම ලැබෙන පරිදි වැඩ පිළිවෙල සකස් කළ යුතු ය.

➢ තමා වෙත තැපැල් මගින් ලැබෙන රක්ෂණ පැකට්ටු විවෘත කිරීමකින් තොරව සුරක්ෂිතව ගබඩා කර ගත යුතු ය. එමෙන්ම රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු ලැබෙන පරිදි අදාළ තොරතුරු ජර්නලයේ සටහන් කළ යුතු ය.

- තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා නියම කර ඇති දිනයන්ට අදාළව එක් එක් දිනයට කැඳවන තැපැල් ඡන්දදායකයින් නම් වශයෙන් තීරණය කරන නිලධාරීන්ට කල්තබා දැනුම් දිය යුතු ය.

- එම කටයුතු නිරීක්ෂණය සඳහා නියෝජිතයන් දෙදෙනෙකු බැගින් සහභාගී කරවන ලෙස බලයලත් නියෝජිතයන්/කණ්ඩායම් නායකයන් වෙත දැනුම් දිය යුතු ය.

- තැපැල් ඡන්දදායකයින් වශයෙන් පැමිණෙන පුද්ගලයින්ගේ ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු විවෘත කිරීමට පෙර ඡන්දදායකයාගේ හැඳුනුම්පත අනුව අනන්‍යතාවය තහවුරු කර ගැනීම අත්‍යාවශ්‍යය.

- ඡන්ද පත්‍රිකාව රහස්‍ය ආකාරයෙන් සලකුණු කිරීමට ඡන්දදායකයින්ට අවස්ථාව සලසා දිය යුතු ය.

- සළකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව රහස්‍යතාව රැකෙන පරිදි තැපැල් ඡන්දහිමියා ඉදිරියේම නියමිත කවර වල බහා මුද්‍රා තබා එදිනම අදාළ තේරීම්භාර නිලධාරී වෙත රක්ෂණ තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කාර්යාලය වෙත භාර දිය යුතු ය. මේ සඳහා කල් තබා අදාළ තැපැල් කාර්යාලය සමඟ සාකච්ඡා කිරීම සුදුසු ය.

- මෙම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා බලයලත් නියෝජිතයන් / කණ්ඩායම් නායකයින් විසින් පත් කරන ලද නියෝජිතයින්ට සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර දෙනු ලබන මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වලින් නම් කරනු ලබන නිරීක්ෂකයින්ට ක්‍රියාවලිය නිරීක්ෂණයට අවස්ථාව සලසා දිය යුතු ය.

- තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා එවනු ලබන සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ඒ සඳහා පහසුකම් සැලසිය යුතු ය.